

ලෙව් තොල්ස්තෝයි

ළමා කතා

රුසියානු මහා ගත්කරු ලෙව් තොල්ස්තෝයි (1828—1910) ළමයින් සඳහා කෙටි කතන්දර පොත් කීපයක් ලියුවේය. ලෝක සාහිත්‍යයේ රත්නාගාරයට මේවා අයත්ය.

මේ කතන්දර පොතේ චිත්‍ර ඇඳ ඇත්තේ ඇකැඩැමීෂියන් ධූරය දරන මහා චිත්‍ර ශිල්පී ඒ. පහෝමොව්ය. ලෙව් තොල්ස්තෝයිගේ ඉතාම හොඳ ළමා කතා මේ පොතට ඇතුළ් කර ඇත.



ලෙව් තොල්ස්තෝයි

ළමා කතා

සී/ස ප්‍රගති ප්‍රකාශන නිවස
අංක 91, ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා මාවත, කොළඹ 08





පූසි පැටියා

අයියා කෙනෙකුයි, නංගී කෙනෙකුයි හිටියා. අයියාගේ නම වාස්යා. නංගීගේ නම කාත්යා. මේ ගොල්ලන්ට පූසෙකු හිටියා. වසන්ත කාලෙදි පූසා නැතිවුණා. ළමයි දෙදෙනා ඌව හැම තැනම හෙව්වා, නමුත් හොයාගන්ට බැරි වුණා. දවසක් ද පිදුරු මඩුව ළඟ මේ දෙදෙනා සෙල්ලම් කරමින් ඉන්නකොට, පූසෙක් ඤාව් ගාලා කෑගහන හඬ ඇසුණා. වාස්යා ඉණිමඟ දිගේ පිදුරු මඩුවේ වහළට නැංගා. කාත්යා බිම හිටගෙන අයියාට කතා කළා: ''හොයා ගත්තද? හොයා ගත්තද?''

වාස්යා සෙව්වා මිස කතාකළේ නැහැ.

''හොයා'ගත්තා! අපේ පූසා... ඌට පැටව් ලැබිලා. හරිම ලස්සන පූස් පැටව් නංගි ඉක්මනින් මෙහෙ එන්න!'' කියලා වාස්යා කිව්වා.



කාත්‍යා ගෙදර ගිහිල්ලා පූසට කිරි ටිකක් ගෙනාවා. පූසට පැටව් පස් දෙනෙකු ලැබිලා. පූසි පැටව් තරමක් ලොකු වුණා. උන් ඇවිදින්ට පටන් ගත්තයින් පස්සෙ ළමයි දෙදෙනා එක පූසි පැටියකුව තෝරාගෙන ගෙදර ගෙනගියා. ඌ බොහොම ලස්සනයි. උගේ ඇඟ අලු පාටයි. කකුල් සුදු පාටයි. ළමයින්ගේ අම්මා ඉතිරි පූසි පැටවුන්ව අහළ පහළ ගෙවල්වලට බෙද දුන්නා. ළමයි දෙදෙනා ඒ ගොල්ලන්ගෙ පූසි පැටියා සමග සෙල්ලම් කළා. ඌව හුරතල් කළා. පූසි පැටියා නිදගත්තේත් ළමයින්ගේ ඇඳේ.

දවසක් ද ළමයි දෙදෙනා පූසි පැටියාත් අරගෙන පාර අයිනට ගියා සෙල්ලම් කරන්ට.

පාර අයිනේ තිබුණු පිදුරු ගහක් සුළඟට සෙළවුණා. පූසි පැටියා පිදුරු ගහ සමග සෙල්ලම් කළා. ළමයි දෙදෙනා ඌ දිහා බලා සතුටු වුණා. පාර අයිනේ තණ බිස්සක තම්පලා ගස් දැකපු ළමයි දෙදෙනා ඒවා උදුරන්ට පටන් ගත්තා. පූසි පැටියා ගැන ඒ ගොල්ලන්ට අමතක වුණා.

‘‘නැවතියන්! නැවතියන්!’’ කියල කවුදෝ කෑගහන හැටි මේ දෙදෙනාට හිටි හැටියේම ඇහුනා. අශ්වයකු පිට නැග ගත් දඩයක්කාරයෙක්, තමාගේ





දඩයම් බල්ලන්ට කෑ ගහන හැටි ඔවුන්ට ඇහුනා. දඩයම් බල්ලෝ දෙදෙනා පූසි පැටියා වෙතට කඩා පනින්ට දුවගෙන ආවා. පූසි පැටියා පැන දුවන්නේ නැතිව, මෝඩ කමට උඩුබැලි අතට පෙරළිලා. බල්ලන් දිහා බලාගෙන හිටියා. කාත්යා බල්ලන්ට බයවෙලා ඈතට දුවගියා. වාස්යා පූස් පැටියා බේරාගන්ට ඌ ළඟට දුවන්ට පටන් ගත්තා. දඩයම් බල්ලෝ දෙදෙනාත් පූසි පැටියා



අල්ලාගන්ට දුවගෙන ආවා. වාස්යා මුණින් අතට වැටිලා, පූසි පැටියාව බල්ලන්ට හපා කෑමට ඉඩ නොදී, තමාගේ ඇඟෙන් උඟුව වැහුවා.

එතකොටම අශ්වයා පිට නැගී ආ දඩයක්කාරයා බල්ලන්ව එළවා දැම්මා. වාස්යා පූසි පැටියාව ගෙදර ගෙනාවා. එද ඉඳලා වාස්යා ගෙවත්තෙන් එපිටට පූසි පැටියාව ගෙනගියේ නැහැ.

ගෑනු ළමයා සහ හතු

ගෑනු ළමයි දෙදෙනෙක් හතු එකතු කරගෙන ගෙදර ගියා.

ගෙදර යාමට දුම්රිය පාරක් හරහා යන්ට ඕන.

දුම්රිය බොහෝ ඈත කියලා හිතපු මේ දෙදෙනා පස් කණ්ඩියට නැංගා. ඊට පස්සෙ දුම්රිය පාරෙ රේල් පීලි හරහා යන්ට පය තැබුවා.

''නංගී, යන්න ඒපා!'' කියලා අක්කා කෑ ගැසුවා.

දුම්රිය හොඳටම ළං වෙලා. දුම්රිය යන්ත්‍රයේ ගෝසාව හන්ද නංගීට අක්කාගේ කට හඬ ඇසුණේ නැහැ. ආපහු දුවන්ට කියලා අක්කා කිව්වා කියා නංගී සිතුවා. ඈ ආපහු දුවන කොට, ඇගේ හතු බිම වැටුනා. ඈ දුම්රිය පාර පුරා වැටී තිබුණු හතු අහුලන්ට පටන් ගත්තා.



දුම්රිය යන්ත්‍රය හොඳටම ළං වෙලා. රිය පදවන්නා නළාව පිම්බා.

''හතු වීසිකරලා වරෙන්!'' කියලා අක්කා කෑ ගැහැව්වා. ගෝසාව නිසා අක්කා කී දේ ඇහුනේ නැහැ. බිම වැටුණු හතු ඇහිඳින්ට අක්කා කියනවා කියලා හිතපු නංගී, දුම්රිය පාර දිගේ බඩගාමින් හතු එකතු කරන්ට පටන් ගත්තා.

දුම්රිය පදවන්නාට යන්ත්‍රය නවත්වන්ට බැරිවුණා. ඔහු මහ හයියෙන් නළාව හඬවලා බිම වැතිර සිටි ගෑනු ළමයාට උඩින් දුම්රිය පැදෙව්වා.


අක්කා කෑ ගසමින් හැඬුවා. දුම්රියේ ගමන් කළ අය මොනවා වුණාද කියලා දැනගන්ට ජනේලවලින් පිටත බැලුවා. දුම්රිය ගාඩ් තැන අන්තිම දුම්රිය මැදිරියට දුවගියා, ළමයාට මොනවා වුණාද කියා බලන්ට.



දුම්රිය වේගයෙන් ගියා. ගැනු ළමයා දුම්රිය පිලි දෙක අතර ඇති මගේ මුණින් අතට වැටිලා හෙළවෙන්නේවත් නැතිව හිටියා.

දුම්රිය බොහෝ ඈත ගිය පසු ළමයා හිස ඔසවා බලා, දණගසා නැගිටලා, හතු එකතු කරගෙන අක්ක ළඟට දුවගෙන ගියා.





ප්ලම් ඇටය


දවසක්ද අම්මා ප්ලම් ගෙඩි කීපයක් ගෙනාවා. දවල් බතෙන් පස්සෙ ළමයින්ට ප්ලම් ගෙඩි බෙදදීමටයි අම්මා ලෑස්ති වුණේ. වාන්යා කිසිම දවසක ප්ලම් ගෙඩි කාලා නැහැ. ඔහු ප්ලම් ගෙඩි අතට අරගෙන ඒවා සිඹින්ට පටන් ගත්තා. ප්ලම් ගෙඩිවල පුසුඹ බලන්ට ඔහු බොහොම සතුටු වුණා. ඒවායේ රස බලන්ට ඔහු බොහොම ආශා කළා. හැම තිස්සේම ප්ලම් ගෙඩි ළඟින් ඔහු එහා මෙහා ගියා. කෑම කාමරයේ කිසිවෙක් හිටියෙ නැති වෙලාවකදී, වාන්යා හොරෙන්ම ප්ලම් ගෙඩියක් අරගෙන කටේ දමා ගෙන කෑවා. දවල් කෑමට ඉස්සෙල්ලා ප්ලම් ගෙඩියක් අඩුවෙලා තියෙන සැටි අම්මා දැක්කා. අම්මා මේ ගැන තාත්තාට කීවා.


දවල් කෑමට වාඩිවෙලා තාත්තා ළමයින්ට කතා කරලා මෙහෙම කිව්වා: ''ළමයිනේ ප්ලම් ගෙඩියක් කෑවේ කව්ද?'' ''අපි කෑවේ නැහැ.'' කියලා ළමයි හැමදෙනාම පිළිතුරු දුන්නා. ''මම කෑවේ නෑහැ'' කියලා වාන්යා කියන කොට ඔහුගේ මුහුණ ජම්බු ගෙඩියක් වගෙ රතු වුණා.

''නුඹලා කෑවේ නැතිනම් ඒක බොහොම හොඳා. නමුත් කාරණය එය නොවෙයි. ප්ලම් ගෙඩි ඇතුළෙ ඇට තියෙනවා. ඒවා කන හැටි නොදන්න ළමයි ඇට ගිලිනවා. බැරිවෙලා වත් ඇටයක් ගිලුනොත් පහුවදට ඒ ළමයා මැරිලා යාවි. මම බයවෙන්නෙ ඔය හන්ද'' කියලා තාත්තා ළමයින්ට කීවා.

වාන්යාගේ මුහුණ සුදුමැලි වුණා. ''නෑ, මම ප්ලම් ඇටය ජනේලයෙන් එළියට වීසි කළා'' කියලා වාන්යා තාත්තාට කීවා.

එතකොට හැමදෙනාම හිනාවුණා. වාන්යා විතරක් ඇඬුවා.





කුරුල්ලා

සෙර්ගේයි උපන් දවසෙ උත්සවයෙදි ඔහුට බොහොම තෑගි ලැබුණා. බමර, ලී අශ්වයො සහ පින්තූර ඔහුට තෑගි දුන්නා. හොඳම තෑග්ග ලැබුනේ මාමාගෙන්. ඔහු සෙර්ගේයිට කුරුල්ලන් අල්ලන දැලක් තෑගි දුන්නා. රාමුවකුයි, ලෑල්ලකුයි දැලට සවි කර තිබුණා. ලෑල්ල උඩට කෑම ටිකක් දලා දැල ගෙවත්තෙ තියනවා. කුරුල්ලෙක් කෑම දැකලා ලෑල්ලට වහපු හැටියෙම දැල ඉබේටම උගේ ඇඟට වැටෙනවා. සෙර්ගේයි බොහොම සතුටු වෙලා තෑග්ග අම්මාට පෙන්නුවා.

''මේක එතරම් හොඳ සෙල්ලම් බඩුවක් නොවෙයි. කුරුල්ලන් අල්ලන්නෙ මොකටද? උන්ට හිරිහැර කරන්ට පුතා කැමතිද?'' අම්මා ඇසුවා.

''මම උන්ව කූඩුවක දලා ඇති කරන්නම්. උන්ට කෑම දෙන්නම්. උන් සින්දු කියාවි.''

සෙර්ගේයි ඇට වගයක් හොයා ගෙන ඒවා ලෑල්ල උඩ තියලා කුරුල්ලන් අල්ලන දැල ගෙවත්තේ තැබුවා. ඔහු දැල ළඟ බොහෝ වේලාවක් හිටගෙන හිටියා. එක කුරුල්ලෙක්වත් දැල අසලට ආවේ නැහැ. උන් සෙර්ගේයිට බයවුණා. පසුව ඔහු දවල් බතට ගෙදර ගියා. ආපහු ගෙවත්තට එන විට දැලට පුංචි කුරුල්ලෙකු අහුවෙලා හිටියා. ඌ බොහොම හයියෙන් කොටන්ට පටන් ගත්තා. සෙර්ගේයි බොහොම සතුටු වෙලා කුරුල්ලාව ගෙදර ගෙනැවිත්, අම්මාට කතා කරලා මෙහෙම කීවා:

''අම්මේ! බලන්න මම කුරුල්ලෙකු ඇල්ලුවා. මූ සැළලිහිණියෙක් වෙන්ට ඕන. බලන්න උගේ හදවත ගැහෙන හැටි!''



''මේකා චීෂ් වර්ගයට අයිති කුරුල්ලෙක්. ඌට හිරිහැර නොකර ඌව නිදහස් කරපන්.'' අම්මා කීවා.

''නැහැ, මම ඌට කෑම දෙන්නම්. වතුර දෙන්නම්.''

සෙර්ගේයි ඌව කූඩුවක දමා දවස් දෙකක්ම නොයෙකුත් ඇට ජාති ගෙනැවිත් ඌට කෑමට දුන්නා. වතුර දුන්නා. කූඩුව සුද්ද කළා. තුන්වැනි දවසෙදි කුරුල්ලාට කෑම දෙන්ටයි, වතුර දෙන්ටයි ඔහුට අමතක වුණා.

''ඔන්න පේනවද! නුඹ කුරුල්ලා ගැන අමතක කළා. ඌව නිදහස් කරපන්!'' අම්මා ඔහුට කීවා

''නැහැ. මට අමතක වුණේ නැහැ. මම දැන්ම කෑමයි, වතුර තියන්නම්. කූඩුව සුද්ද කරන්නම්.''

සෙර්ගේයි කූඩුවෙ දෙර හැරලා සුද්ද කරන්ට පටන් ගත්තා. කුරුල්ලා බයවෙලා කූඩුවට කොටන්ට පටන් ගත්තා. කූඩුවෙ දෙර වහන්ට අමතක වුණු සෙර්ගේයි ඌට වතුර ගේන්ට ගියා. දෙර වසා නැති බව දුටු අම්මා පුතාට කතා කළා:


''සෙර්ගේයි ඉක්මනට දෙර වහන්න. නැතිනම් කුරුල්ලා ඉගිලී යාවි!''

අම්මා මෙහෙම කීවා විතරයි, කුරුල්ලා දෙර ඇර තියෙනවා දැකලා සතුටු වෙලා, කූඩුවෙන් පිටවී, පියාඹා ගියා. ජනේලයේ වීදුරු දෙර වසා තිබෙන සැටි ඌ දැක්කේ නැහැ. වේගයෙන් පියාඹා ගිහින් ඌ ජනේල වීදුරුවේ හැප්පිලා ජනෙල් පඩිය උඩ වැටුණා. පියාපත් දිගහැර ගෙන උඩුබැලි අතට වැටිලා ඌ අමාරුවෙන් හුස්ම ගත්තා. සෙර්ගේයි කුරුල්ලා දෙස බලාගෙන ඇඬුවා.

''අම්මේ දැන් ඉතින් මම මොනවා කරන්නද?''

''දැන් ඉතින් කළ හැකි දෙයක් නැහැ.'' අම්මා කිව්වා.

සෙර්ගේයි කුරුළු කූඩුව ළඟ වාඩිවෙලා කුරුල්ලා දිහා බලාගෙන හිටියා. කුරුල්ලා උඩුබැලි අතට පෙරළී අමාරුවෙන් හුස්ම ගත්තා. ඔහු නිදගන්ට යනවිටත් කුරුල්ලා බොහොම අමාරුවෙන් තමා හිටියෙ. සෙර්ගේයිට එද රෑ නින්දක් නැහැ. කුරුල්ලා බිම වැටී, පියාපත් දිගහැර ගෙන හුස්ම ගන්නා සැටි ඔහු හීනෙන් කීප වරක්ම දුටුවා. උදේ නැගිට්ට හැටියෙම සෙර්ගේයි කුරුල්ලා බැලීමට ආවා. ඌ දැන් වකුටු වෙලා හරස් පොල්ල උඩ ලැගලා හිටියා. එද ඉඳලා සෙර්ගේයි කුරුල්ලන් ඇල්ලීමට කවදාවත් ගියේ නැහැ.






බොරු කියන්නා

කොල්ලෙක් බැටළු රැළක් රැකබලා ගෙන හිටියා. හිටිහැටියේම කොල්ලා කෑ ගහන්ට පටන් ගත්තා. ''වෘකයෙක් ඇවිත් බැටළුවන් කනවෝ! බේරා ගනිල්ලා! බේරා ගනිල්ලා!'' මිනිස්සු දුවගෙන ආවා බැටළු රැළ බේරාගන්ට. කිසිම වෘකයෙක් හිටියේ නැහැ. කොල්ලා බොරු කී බව දැනගත් ගොවියෝ යන්ට ගියා. මේ විදිහට දෙතුන් දවසක්ම කොල්ලා බොරුවට කෑ ගැහුවා. ගොවියෝ ඇවිත් වෘකයින් නැති බව දැනගෙන යන්ට ගියා. දවසක් ද හැබෑටම වෘකයෙක් බැටළු රැළට කඩා පැන්නා. ''වෘකයෙක් ඇවිත් බැටළුවන්ව කනවෝ! බේරා ගනිල්ලා! බේරා ගනිල්ලා!'' කියලා බයවුණු කොල්ලා කෑ ගැහුවා. මේ කොල්ලා නැවත බොරු කියනවා කියලා හිතපු ගොවියෝ බැටළු රැළ බේරාගැනීමට ගියේ නැහැ. මිනිසුන් එන්නෙ නැති බව දැනගත් වෘකයා එක එක බැටළුවා බැගින් මරාගෙන කෑවා.





මිතුරෝ දෙදෙනෙක්



දවසක් ද මිතුරෝ දෙදෙනෙක් කැලෑ පාරක් දිගේ ගමන් කළා. වලසෙකු දුටු එකෙක් දුවගෙන දුවගෙන ගිහිල්ලා ගහකට නැග ගත්තා. අනිකාට කරගන්ට දෙයක් නැතිවුණා. ඔහු බිම වැටිලා මළාක් මෙන් හිටියා.

බිම වැටී හිටි ළමයා ළඟට ආ වලසා ඔහුගේ මුහුණ ඉව කරලා ඔහුට පණ තියනවද කියලා සොයා බැලුවා. ළමයා හුස්ම නොගෙන මළා වගෙ හිටියා.

ළමයා මළා කියා සිතූ වලසා ඉවත ගියා.

වලසා ගිය පසු ගහෙන් බිමට බැස ආ ළමයා හිනාවෙන්ට පටන් ගත්තා:

''වලසා නුඹේ කනට කොඳුරා කීවේ මොනවාද?'' ඔහු ඇසුවා.

''විපතේදී මිතුරාව අතහැර පැන යන මිනිස්සු නරක අය බව වලසා කීවා'' බිම වැටී සිටි ළමයා පිළිතුරු දුන්නා.




හංසයෝ


හංසයෝ රෑනක් සීත රටවල සිට උණුසුම් රටවලට පියාඹන්ට පටන් ගත්තා. උන් මුහුද උඩින් පියාඹා ගියා. උදේ සිට රෑ වන තුරුත්, පසුවද උදේ සිට රෑ වන තුරුත් පියාඹමින් ගියා. විවේක ගැනීමටවත් නවතින්නේ නැතිව මුහුද උඩින් පියාසර කළා. හොඳට හඳ පායලා තිබුණා. මහ මුහුදේ නිල් පාට වතුර විතරයි හංසයින්ට පෙනුණේ. උන් බොහොම මහන්සි වුණාට පියාසර කිරීම නැවැත්තුවේ නැහැ. පියාපත් ගසමින් නොනවත්වා පියාසර කළා. ඉස්සරහින් පියාසර කළේ ලොකු, ශක්තිමත් හංසයින්. තරුණ, දුර්වල හංසයෝ පිටුපසින් පියාසර කළා. එක් තරුණ හංසයෙක් අනිත් එවුන්ට පිටුපසින් පියාසර කළා. ඌ හොඳටම දුර්වල වුණා. පියාපත් ගැසුවාට පියාසර කිරීමට තරම් ශක්තියක් ඌට තිබුණේ නැහැ. ඌ සෙමින් සෙමින් මුහුදට පාත් වුණා. අනිත් හංසයෝ ඈත අහසේ පියාඹා ගියා. උන් හඳ ළඟටම වෙලා පියඹන සැටි මුහුදට පාත් වුණු හංසයාට පෙනුණා. ඌ මුහුදේ පීනන විට මුහුදේ වතුර හඬනගන සැටි ඇසුණා. ඌ මුහුදේ වතුරට උස් පහත් වෙමින් හෙමින් පැද්දුනා. ඈත අහසේ පියාඹන හංස රෑළ සුදු ඉරක් වගේ හඳ එළියට පෙණුනා. උන්ගේ පියාපත් ගැටෙන සැටි යම්තමින් ඌට ඇසුණා. උන් නොපෙනී ගියා. තරුණ හංසයා බෙල්ල පස්සට හරවා ගෙන ඇස් පියාගත්තා. ඌ හෙලවුණේ නැහැ, නමුත් මුහුදේ වතුර උස් පහත් වෙන විට ඌ පැද්දුනා. උදෑසන ඉර පායන්න ඉස්සෙල්ලා සිසිල් සුළඟක් හමා ගියා. හංසයාගේ සුදු පාට බෙල්ල වතුරට තෙමුනා. ඌ ඇස් ඇරලා බැලුවා. නැගෙනහිර අහස රතු පාට වෙලා. හඳයි, තරුයි සුදුමැලි වෙලා. හංසයා සුසුමක් හෙළා පියාඹන්ට පටන් ගත්තා. උගේ පියාපත්වල අග යම්තම් වතුරට වැදුනා. ඌ සෙමින්, සෙමින් අහසට නැගලා උණුසුම් රටවල් බලා පියාසර කළා. උණුසුම් රටවල් බලා ගිය තම මිතුරු හංසයින් සොයා ඌ ගොළු මුහුද උඩින් පියාසර කළා.



ඇතා

ඉන්දියාවේ එක මිනිහකුට ඇතෙක් හිටියා. ඔහු ඇතාට සෑහෙන්ට කෑම දුන්නේ නැහැ. උගෙන් බොහොම වැඩ ගත්තා. ඇතාට කේන්ති ගිහින් දවසක්ද මිනිහාව පාගලා මරා දැම්මා. එතකොට මිනිහාගේ බිරිඳ අඬා වැලපී, ඔහුගේ දරුවන් ඇතා ළඟට ගෙනැල්ලා, උගේ පා ළඟට ඔවුන් වීසිකළා. ''ඇතා! නුඹ මේ ළමයින්ගේ තාත්තාව මරා දැම්මා. දැන් ඉතින් මේ දරුවන්වත් මරා දමාපන්'' කියලා ඈ ඇඬුවා. ඇතා ළමයින් දිහා බැලුවා. වැඩිමල් පිරිමි ළමයාව හොඬෙන් අලල්ාගත් ඇතා ඔහු තමාගේ පිට උඩ තබා ගත්තා. එදා සිට ඒ ළමයා කියන විදිහට වැඩ කරමින් ඌ ඔවුන්ට උදව් කළා.







ගේ කුරුල්ලා සහ වැහි ලිහිණියෝ

දවසක් ද ගෙවත්තේ සිට වහළ යට තිබුණු වැහි ලිහිණි කූඩුවක් දෙස මම බැලුවා. කූඩුවෙ සිටි වැහි ලිහිණි ජෝඩුව පියාඹා ඉවත ගියා.

ගේ කුරුල්ලෙක් වහළේ සිට වැහි ලිහිණි කූඩුව ළඟ වහලා වටපිට බැලුවා. පුංචි පියාපත් වනලා කූඩුව තුළට රිංගලා, ඔළුව එළියට දගෙන කීචි බීචි ගෑවා.

ටික වෙලාවකට පස්සෙ වැහි ලිහිණියෝ තම කූඩුවට ආවා. ගේ කුරුල්ලාව දුටු උන් දෙදෙනා කූඩුව වටේ පියාඹමින්, පියාපත් ගහලා හයියෙන් හඬ නගලා ඉවතට පියාඹා ගියා.

ගේ කුරුල්ලා වැහි ලිහිණි කූඩුවට වෙලා කීචි බීචි ගාමින් හිටියා.

ඊට පස්සෙ වැහි ලිහිණි රැනක්ම ගේ කුරුල්ලා බැලීමට වගේ පියාඹා ආවා. උන් ආපහු ඉවතට පියාසර කළා.

ගේ කුරුල්ලා කලබල නොවී හිටියා. ඔළුව ඒ අත මේ අත හරවා ඌ ගී කිව්වා.

වැහි ලිහිණියෝ නැවත ඇවිත් කූඩුවට මොනවදෝ කරලා පියාඹා ගියා.

වැහි ලිහිණියෝ නිකම්ම ආවේ නැහැ. උන් එක එකා හොටෙන් කුණුරොඩු ටික ටික ගෙනැවිත් කූඩුවේ කට වහන්ට පටන් ගත්තා.

උන් නැවත නැවත ඇවිත් කූඩුවේ කට කුණු රොඩුවලින් වැහුවා. වැහි ලිහිණි කූඩුවේ කට පුංචි වෙන්ට පටන් ගත්තා.

ඉස්සෙල්ලා ගේ කුරුල්ලාගේ බෙල්ල පෙනුණා. පස්සෙ ඔළුව විතරක් පෙනුණා. ඊට පසුව හොට විතරක් පෙනුණා. අන්තිමට කිසිවක් පෙනුණේ නැහැ. වැහි ලිහිණියෝ කූඩුවේ කට එහෙම පිටින්ම වසා දැම්මා. ඉන් පස්සෙ උන් කෑ ගසමින් ගේ වටේ පියාසර කළා.





රාජාලියා

මහ පාරක් අසල ලොකු ගහක කූඩුවක් හදගත් රාජාලියෙක් පැටවු ගැහැව්වා. මේ කූඩුව තිබුණේ මුහුදෙන් බොහොම ඈත.

ගහ අසල මිනිසුන් කීප දෙනෙක් වැඩ කරමින් ඉන්නකොට රාජාලි අම්මා මුහුදෙන් ලොකු මාළුවෙකු ඩැහැගෙන පැටව් ළඟට ආවා. මාළුවා දුටු මිනිස්සු ගහ වට කරගෙන කෑ ගහන්ටයි, රාජාලියාට ගල් ගහන්ටයි පටන් ගත්තා. රාජාලියා මාළුවා බිම දැම්මා. මිනිස්සු මාළුවා අරගෙන ගියා.

රාජාලියා කූඩුව අයිනෙ වහලා හිටියා. රාජාලි පැටව් කෑම ඉල්ලා කෑ ගහන්ට පටන් ගත්තා.

රාජාලියාට බොහොම මහන්සි හන්ද ආයෙමත් මූදට පියාඹා යන්ට ශක්තිය තිබුණේ නැහැ. ඌ තම පැටවු පියාපත්වලින් වහගෙන හුරතල් කළා. උන්ගේ පිහාටු හොටෙන් පිස දැම්මා, ටිකක් ඉවසන ලෙස රාජාලි අම්මා පැටවුන්ගෙන් ඉල්ලා හිටියා වගෙ. පැටවුන්ව වැඩියෙන් හුරතල් කළ තරමට උන් කෑම ඉල්ලා කෑ ගැසුවා.

එතකොට රාජාලි අම්මා ඉහළ අත්තකට පියාඹා ගියා.

පැටවු වැඩියෙන් කෑ ගහන්ට පටන් ගත්තා.

රාජාලි අම්මා මහ හයියෙන් හඬනගා පියාපත් වනලා මුහුද දෙසට පියාඹා ගියා.

හවස ඇඳිරි වැටුණයින් පසු රාජාලි අම්මා සෙමින්, සෙමින් පහළින් පියාඹා ආවා. ඌ ආවේ ලොකු මාළුවකු ඩැහැගෙනයි.

ගහ ළඟට ආ රාජාලි අම්මා වට පිට බැලුවා මිනිසුන් නැතිද කියලා දැනගන්ට. ඉක්මනට ඌ කූඩුව අයිනෙ වැහැව්වා.

රාජාලි පැටව් කටවල් ඇරලා කෑම ඉල්ලුවා. රාජාලි අම්මා මාළුවා කෑලි වලට ඉරලා පැටවුන්ට බෙදු දුන්නා.





මිනී මෝරා

අපේ නැව අප්‍රිකානු වෙරළ අසල නැංගුරම් දමා තිබුණා. එද කාල ගුණය බොහොම හොඳයි. මුහුදේ සිට සිසිල් සුළං අප දෙසට හැමුවා. හවස් වෙනකොට කාල ගුණය වෙනස් වුණා. සහරා කාන්තාරයේ සිට උණුසුම් සුළං හැමුවා. ඒ සුළං ගිනි උදුනකින් හමන සුළං වගේ. හුස්ම ගැනීම පවා අපහසු වුණා.

හවස හිරු බැසයන කොට නැවේ කපිතන් ඇවිත් නාවිකයින්ට කතා කරලා මෙහෙම කිව්වා: ''නැවේ ජල තටාකයට පැනලා නාපල්ලා!'' විනාඩියකින් නැවියෝ ලොකු කැන්වස් රෙද්දක් මුහුදට දමලා එයින් ජල තටාකයක් හදලා නාන්ට පටන් ගත්තා.

නැවේ අප සමග කොල්ලෝ දෙදෙනෙක් හිටියා. ඉස්සෙල්ලාම මුහුදට පැන්නේ මොවුන් දෙදෙනයි. ජල තටාකය තුළ නාවිකයෝ බොහොම දෙනෙක් නාන හන්ද මේ දෙදෙනාට ඉඩ මදි වුණා. කොල්ලෝ දෙදෙනා මහ මුහුදේ තරඟෙට පීනන්ට පටන් ගත්තා.

මේ දෙදෙනා පීනන්ට හරිම හපන්නු. නැවේ බෝයාව දක්වා දුර පීනා ගියා.

එක කොල්ලෙක් තම මිතුරාව පරදවා දුර පීනා ගියා. පසුව ඔහුට මහන්සි දැනුණු හන්ද හෙමින් පීනන්ට පටන් ගත්තා. මේ ළමයාගේ තාත්තා කාල තුවක්කු හමුදාවේ හිටපු සෙබළෙක්. ඔහු නැවේ සක්මන් තට්ටුවේ හිටගෙන පුතා දිහා බලා බොහොම සතුටු වුණා. කොල්ලා හෙමින් පීනන්ට පටන් ගත්තාම ''පුතේ පමාවෙන්ට එපා! ඉක්මනට පීනපන්!'' කියලා කෑ ගැසුවා.

හිටි හැටියේම නැවේ හිටි මිනිහෙක් මහ හඬින් කෑ ගැසුවා: ''මිනී මෝරෙක්!'' මිනිසුන්ව පවා හපා කන නපුරු මාළුවාගේ පිට වතුරේ නලියන සැටි අපට පෙනුණා. මිනී මෝරා කෙළින්ම කොල්ලන් දෙදෙනා දෙසට පිනුවා.

''ආපහු පීනපල්ලා! නැවට පීනපල්ලා! මිනී මෝරෙක්!'' කියලා හිටපු කාල තුවක්කු හමුදාවේ සෙබළා කෑ ගැසුවා. එහෙත් ළමයින්ට එය ඇසුනේ නැහැ. ඔවුහු දෙදෙනා සිනාසෙමින්, වඩාත් හයියෙන් කෑ ගසමින් තවත් ඈතට පීනුවා.



සෙබළ තාත්තාගේ මුහුණ සුදු රෙද්දක් වගේ සුදුමැලි වුණා. ඔහු ළමයින් දෙස බලාගෙන හිටියා. නැවියෝ හනිකට බෝට්ටුවක් මුහුදට දමා වේගයෙන් ළමයින් දෙදෙනා දෙසට පැද්දා. එහෙත් ළමයි දෙදෙනා තවත් ඈතට පීනුවා. මිනී කන මෝරා ළමයින්ට ළං වුණා. දැන ඔවුන් අතර දුර අඩි විස්සක් විතර ඇති.

ඉස්සෙල්ලා අපේ කෑ ගැසීම් ඔවුන් දෙදෙනාට ඇහුනේ නැහැ. ඔවුහු මිනී මෝරාව දුටුවේ නැහැ. පස්සේ එක ළමයෙක් හැරී බැලුවා. මෝරාව දුටු ඔහු බොහොම බයවෙලා කෑ ගැසුවා. ඔවුහු දෙදෙනා දෙපැත්තට පීනන්ට පටන් ගත්තා.

මේ කෑ ගැසීම හන්ද සෙබළ තාත්තා අවදි වුණා වගේ කඩිසර වුණා. ඔහු වේගයෙන් කාල තුවක්කුව දෙසට දිව ගියා. කාල තුවක්කු කඳ මෝරා දෙසට හරවා ඉලක්කය ඇල්ලුවා. වෙඩි උණ්ඩයක් කාල තුවක්කුවට දමා සේව නූල ඇද්දා.

නැවේ හිටි අපි මොනවා වේදැයි නොදන බොහොම බයවෙලා, ගල් ගැහිලා බලාගෙන හිටියා.


වෙඩි හඬක් ඇසුණා. සෙබළ තාත්තා කාල තුවක්කුව ළඟ වැටිලා දෑතින් මුහුණ වසා ගත්තා. මෝරාටයි ළමයින්ටයි මොනවා වුණාද කියල අප දුටුවේ නැහැ වෙඩි පහර සමගම දුම් වළාවක් පිටවුණු නිසා. විනාඩියක් විතර දුම් හන්ද අපට ඇස් ඇර බලන්ටවත් බැරි වුණා.

දුමාරය තුනීවී ගියායින් පස්සේ හැම දෙසින්ම රහසක් කියන්නා වගේ සීන්, පහත් හඬක් ඇසුණා. පස්සේ ඒ හඬ වැඩි වෙලා බොහොම ප්‍රීතිමත් ගෝසාවකට හැරුනා.

සෙබළ තාත්තා හිස ඔසවා මුහුද දෙස බැලුවා.

මුහුදේ රැල්ලට අසුවුණ මිනී මෝරාගේ කභපාට යටි පැත්ත පා වෙන්ට පටන් ගත්තා. ඌ වෙඩි පහරට මිය ගිහින්. විනාඩි කීපයකින් ළමයින් දෙදෙනාව බෝට්ටුවේ නංවා ගෙන නැවට ගෙනාවා.





පිනුම

ලෝකය වටේ ගිය නැවක් මවුරට බලා යමින් හිටියා. කාල ගුණය බොහොම හොඳ හන්ද නැවේ හැම දෙනම සක්මන් තට්ටුවට ආවා. එතැන හිටිය ලොකු වඳුරෙක් හැම දෙනාවම හිනස්සන්ට පටන් ගත්තා. ඌ උඩ පැන්නා. මුහුණ ඇද කළා. දත් විලිස්සුවා. මිනිසුන්ට විහිළු කළා. ඌ දෙස බලා ඉන්නා බව දැනගත් ඌ වඩාත් දඟ කළා.

කපිතන්ගේ දෙළොස් හැවිරිදි පුතාගේ තොප්පිය උදුරාගත් වඳුරා ඒක උගේ ඔළුවේ දමාගෙන කුඹ ගහක් දිගේ ඉහළට නැග්ගා. හැම දෙනෙක්ම හිනා වුණා. කපිතන්ගේ පුතා විතරක් හිනාවෙන්ටද අඬන්නටද කියා නොදන තොප්පියත් නැතිව ඌ දෙස බලාගෙන හිටියා.

කුඹ ගහේ පළමුවැනි හරස් පොල්ලේ වාඩිවුණු වඳුරා ළමයාගේ තොප්පිය දත්වලින් සහ අත් පා වලින් ඉරන්නට පටන් ගත්තා. ළමයා දෙස බලා ඔහුට සරදම් කරන්නා වගේ දත් විලිස්සන්ට වුණා. ළමයා වඳුරාට සැරවෙලා කෑ ගැහැව්වා. ඌ තවත් තරහ වෙලා තොප්පිය ඉරුවා. නැවියෝ වඩාත් හයියෙන් හිනා වුණා. ළමයා හොඳටම ලජ්ජා හිතිලා කබාය ගළවලා කුඹ ගහ දිගේ නැග්ගා. විනාඩියකින් ළමයා පළමුවැනි හරස් පොල්ලට ළං වුණා. එවිටම වඳුරා හනිකට නැංගා තවත් ඉහළට. ළමයාට තොප්පියට ළං වීමට ඉඩ තැබුවේ නැහැ.

''නුඹ මගෙන් බේරිලා යන්නේ නැහැ'' කියලා ළමයා වඳුරාට කෑ ගසා කිව්වා.

වඳුරා තවත් ඉහළට නැංගා. ළමයාගේ කෝපයත් ලජ්ජාවත් වැඩි වුණා. ඔහු වඳුරා එළවමින් ඉහළ නැංගා. එතකොට වඳුරා කුඹ ගහ මුදුනටම නැගලා පස්සා කකුලෙන් මුදුනේ ලනුව අල්ලා ගෙන, ඉහළම හරස් පොල්ලේ කොණක තොප්පිය එල්ලුවා. ඊට පස්සේ මුදුන් කණුවට නැගලා දත් විලිස්සමින් සතුටු වුණා. වඳුරා තොප්පිය එල්ලූ හරස් පොල්ල අර්ෂිනා දෙකක් (අඟල් 58 ක්) විතර දිගයි. කුඹ ගහේ ලනුව අල්ලාගෙන තොප්පිය ගන්ට බැහැ. තොප්පිය තියන තැනට යන්ට නම් ලනුව අත හරින්ට ඕන.


ළමයා බොහොම උනන්දු වෙලා, ලනුව අතහැරලා හරස් පොල්ල දිගේ යන්ට පටන් ගත්තා.

වඳුරාත්, කපිතන්ගේ පුතාත් අතර මේ සෙල්ලම දුටු මිනිස්සු මෙතෙක් වෙලා හිනා වුණා. ළමයා ලනුව අතහැරලා හරස් පොල්ල උඩ හිටගෙන දෑත් දෙපැත්තට දිගු කර ගෙන ගමන් කරන්ට පටන් ගත්තම බලා හිටිය මිනිස්සු බොහොම බය වුණා.

බැරිවෙලාවත් එහෙම පය ලිස්සුවොත් ඔහු සක්මන් තට්ටුවට වැටිලා කෑලි වලට කැඩේවි. හරස් පොල්ල කොණට ගිහිල්ලා තොප්පිය අතට ගත්තත්, ඔහුට ආපහු හැරිලා කුඹ ගහට යන්ට බැහැ, එතරම් අමාරුයි.

හැම දෙනම නිහඬව, මොනවා වේද කියලා බලාගෙන හිටියා.

හිටි හැටියේම එකෙක් බියෙන් කෑ ගැසුවා.



ඒ මිනිහාගේ කෑ ගැසීම හන්ද ළමයාට හොඳ සිහිය ලැබුණා. ඔහු බිම බැලූ හැටියෙම වැනෙන්ට පටන් ගත්තා. මේ වෙලාවෙදී, නැවේ කපිතන්, ළමයාගේ තාත්තා සක්මන් තට්ටුවට ආවා. මුහුදු ලිහිණියන්ට වෙඩි තබන්ට ඔහු තුවක්කුවක් ගෙනාවා. ඔහු පුතාව දුටු හැටියෙම, තුවක්කුව පුතාට එල්ල කරලා කෑ ගැසුවා:

''වහාම වතුරට පැනපන්, නැතිනම් නුඹට වෙඩි තියනවා!''

ළමයාට තාත්තාගේ කතාව තේරුනේ නැහැ. ඔහු වැනෙන්ට පටන් ගත්තා.

''වහාම වතුරට පැනපන්. නැතිනම් වෙඩි තියනවා! එකයි, දෙකයි...''

තාත්තා ''තුනයි'' කියන කොටම ළමයා දෑත් විදහාගෙන හිස පාත් කරගෙන බිම පැන්නා.

කාල තුවක්කුවක වෙඩි උණ්ඩයක් වගෙ දඩාස් ගාලා ළමයා මුහුදට වැටුනා. එතකොටම බොහොම කඩිසර නාවිකයින් විසි දෙනෙක් වහාම මුහුදට පැනලා ළමයා පැන්න තැනට පීනන්ට පටන් ගත්තා. මුහුද යටට ගිය ළමයා නැවත උඩ ආවේ තත්පර හතළිහකින් විතර. මේ වේලාව බොහොම දිග පැයක් වගේ සක්මන් තට්ටුවේ හිටි අයට දැනුණා. ළමයා මුහුද උඩට මතුවුණු හැටියෙම නාවිකයෝ ඔහු අල්ලා ගත්තා. ඔහුව වහාම නැවට ගෙනාවා. විනාඩි කීපයකින් ඔහුගේ නහයෙන් හා කටින් වතුර එළියට ආවා. ළමයා හුස්ම ගත්තා.

කපිතන් මෙය දුටු හැටියෙම මහ හයියෙන් කෑ ගැසුවා. හරියට ඔහුගේ බෙල්ල කවුදෝ මිරිකුවා වගේ. ඔහු අඬන හැටි නැවේ මිනිසුන්ට නොපෙනෙන්ට, ඔහු තමාගේ කාමරයට ගියා.

සිංහයා සහ බලු පැටියා

ලන්ඩන් නගරයේ මිනිසුන්ට වන සතුන් පෙන්වන සිරිතක් තිබුණා. සතුන් බලන අය මුදල් ගෙවන්ට ඕන නැතිනම් සතුන්ට කෑමට පුංචි බල්ලන් සහ පූසන් ගෙනැවිත් දෙන්ට ඕන.

එක මිනිහෙක් වන සතුන් බලන්ට හිතුවා. ඔහු පාරේ හිටිය බලු පැටියෙකු අල්ලාගෙන සත්තු වත්තට ගෙනාවා. ඔහුට වන සතුන් බැලීමට අවසර ලැබුණා. බලු පැටියාව සිංහයාට කෑමට කූඩුවට දැම්මා.

බලු පැටියා වලිගය හංගාගෙන සිංහ කූඩුවෙ මුල්ලට වෙලා හිටියා. සිංහයා උගේ ළඟට ගිහින් ඉව අල්ලා බැලුවා.

බලු පැටියා උඩුබැලි අතට පෙරලිලා පා උස්සලා වලිගය වැනුවා.

සිංහයා එක් පයකින් බලු පැටියාව අනෙක් පැත්තට පෙරලුවා.

බලු පැටියා පස්සා ගාත් වලින් හිට ගත්තා.

සිංහයා ඔලුව හරව හරවා බලු පැටියා දිහා බැලුවා, නමුත් ඌට හිරිහැර කළේ නැහැ.

සත්තු වත්ත අයිතිකාරයා සිංහයාට කෑමට මස් කෑල්ලක් දැම්මා. ඌ පුංචි මස් කෑල්ලක් බලු පැටියාට වෙන් කළා.

රෑ සිංහයා නින්දට ගියාට පස්සෙ බලු පැටියා සිංහයගෙ කකුලට ඔලුව තියලා නිදගත්තා.

එද සිට සිංහයා සමග බලු පැටියා එකම කූඩුවේ වාසය කළා. සිංහයා ඌට හිරිහැර කළේ නැහැ. ඌ කෑම කෑවා. බල්ලාට ළං වී නිදි ගත්තා. සමහර දවස්වලදී බලු පැටියා සමග සෙල්ලම් කළා.

දවසක් ද එක් මහත්මයෙක් සත්තු වත්තට ඇවිත් තමාගේ බලු පැටියාව හඳුණා ගත්තා. බලු පැටියා තමාගේ හන්ද ඌව බාරදෙන ලෙස ඔහු



ඉල්ලා හිටියා. අයිතිකාරයා බලු පැටියාට කතා කළ හැටියේම, සිංහයා බෙල්ලේ කේශර කෙළින් කරගෙන ගොරවන්ට පටන් ගත්තා.

ඉතින් ඔය විදිහට සිංහයයි බලු පැටියයි එකම කූඩුවක අවුරුද්දක් තිස්සේම ජීවත් වුණා.

ඊට අවුරුද්දකට පස්සෙ බලු පැටියා ලෙඩ වෙලා මළා. සිංහයා කෑම කන්නේවත් නැතිව බලු පැටියාගේ මළ කුණ ඉවකරන්ට පටන් ගත්තා, ලෙවකන්ට පටන් ගත්තා. ඉස්සරහ පාවලින් සොළවා බැලුවා.

බලු පැටියා මළා කියලා තේරුණයින් පස්සෙ සිංහයා බෙල්ලේ කේශර කෙළින් කරගෙන වලිගය වනමින් ගොරවන්නට වුණා. ඌ කූඩුවේ යකඩ පොලු හපමින්, බිම හපමින් පෙරලුනා.

මුළු දවස තිස්සේම ගොරව ගොරවා ඌ කූඩුව ඇතුළෙ ඇවිදලා, බලු පැටියාගේ මළ කුණ ළඟට වෙලා වැටිලා හිටියා. අයිතිකාරයා බලු කුණ එළියට ගන්න ළං වෙන්න හදන කොට, සිංහයා ඒකට ඉඩ දුන්නේ නැහැ.

තවත් බලු පැටියකු සිංහයා ළඟට දැම්මොත් උගේ කණගාටුව නැතිවෙයි කියලා හිතපු අයිතිකාරයා බලු පැටියකුව හොයා ගෙනැවිත් කූඩුවට දැම්මා. සිංහයා එක පාරටම පැනලා ඒ බලු පැටියාව කෑලි වලට ඉරලා දැම්මා. පසුව බලු පැටියාගේ මළ කුණ ළඟට වෙලා දවස් පහක් තිස්සේ වැතිරිලා හිටියා.

හයවැනි දවසේදී සිංහයා මළා.

පටුන

චිත්‍ර: ඒ. පහෝමොව්

අනුවාදය: දූදිගම වී. රූද්රිගු

සී/ස ප්‍රගති ප්‍රකාශන නිවස
91, ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා මාවත, කොළඹ 08
දුරකථන: 011 2669889 ෆැක්ස්: 011 2691610

ISBN 978-955-1319-04-4
9 789551 319045

මිල රු. 200/-